සන්නස SANNASA

# ලියා දැන්වන වග

දැන් ලංකාවේ සියළු ජන කොටස් වල ආරක්ෂාව සම්බන්ධයෙන් අවිනිශ්චිත බවක් ඇතිවී තිබේ.අප පැහදිලි කිරීමට යන්නේ තමාම කල්පනාකාරීව ගොඩ නගා ගත යුතු එක් පැතිකඩක් පිළිබදවය.

පසුගිය දිනෙක කොළඹ ආදුරුප්පුවීදියේ වෙළද සැලෙකින් මිනිසුන් වන්ද්‍යාකරණයට ලක් කල හැකි යැයි සැලකෙන බෙහෙත් පෙති 65,000 ක් හමු විය.මීට පෙර ඒවා කොතෙක් ගෙන්වා ඇත්දැයි හා ඊට පසුව කොතෙක් ගෙනාවාදැයි අපි නොදනිමු. අප පත්‍රයේ පුවතකින්ද එවැන්නක් කියවේ.මේවා ගෙනැවිත් ගබඩා කොට ඇත්තේ ලංකාවේ මුස්ලිම් ව්‍යාපාරිකයින්ය. ස්ත්‍රීන් හෝ පුරුෂයින් වන්ද්‍යාකරණය කල හැකි ඖෂධ ඇත්දැයි අපි නොදනිමු. එහෙත් ගෙනැවිත් ඇති ඖෂධ කිසිදු රෝගයකට භාවිතා කරන ඒවා නොවේ. මේවා ශරීරගත වීමෙන් කුමක් සිදුවේදැයි කීමට අප දන්නේද නැත.එහෙත් අයහපතක් සිදුවිය හැකි බව නම් අනුමාන කළ හැක.තවද සිංහල ස්ත්‍රීන් 4000 ක් ඔවුන්ගේ අනුදැනුමකින් තොරව වන්ද්‍යාකරණය කරන ලද මුස්ලිම් ජාතික නාරි වෛද්‍යවරයෙක් සම්බන්ධව දිවයින පුවත්පත පසුගිය සතියේ හෙළි කිරීම නිසා පාර්ලිමේන්තුව ඇතුළු මුළු රටම උනුසුම් විය. වසරකට එක් වෛද්‍යවරයෙකුට ප්‍රසූත සැත්කම් 185 කට වැඩිය කළනොහැකි යැයි තර්ක කර සොයා බැලීමටත් ප්‍රථම මෙය අසත්‍යයැයි කිවූ මහත්වරුද සිටියහ. වෛද්‍යවරයා අත් අඩංගුවට ගෙන පරීක්ෂණ පැවැත්වීමේදී සැත්කම් අටදාහක් කර ඇති බව ඔහු පිළිගෙන ඇත. ඉන් කී දෙනෙක් වන්ද්‍යාකරනයට ලක් කොට ඇතිදැයි තවම වාර්තා නොවේ. කෙසේ වෙතත් දැන් මව්වරුන් පැමිණිලි කරමින් සිටී.

මින් මා පැහදිලි කරදෙන්නේ මේ අවදානමෙන් ගැලවීම සදහා සිංහල දෙමල මුස්ලිම් ආදී සියලුම වර්ග වලට අයත් ජනතාව ලංකාවේ මුස්ලිම් ඖෂධ වෙළදසැලවල් හා මුස්ලිම් වෛද්‍යවරුන් තාවිකාලිකව වර්ජනය කිරීම සුදුසු බවයි. මුස්ලිම් අයටද මා එසේ කීමට අදහස් කළේ වැරදීමකින් ඔබේ ශරීරය තුළටද අනවශ්‍ය ඖෂධ ඇතුලුවිය හැකි හෙයිනි. රජය මගින් අන්තරාකාරී ඖෂධ කිසිවක් වෙළදපොලේ නැති බැව් සහතික කිරීමෙන් පසුව යළිත් සාමාන්‍ය තත්වයට එළඹිය හැක. මෙම සටහන මුස්ලිම් ජනතාව අපහසුතාවට පත් කිරීම සදහා නොව ඔවුන්ද අපහසුතාවයට පත් වීම වැළක්වීමටය.

**සංස්කරණය / Editor**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by**
**Crystal D** Digital Agency
www.crystald.com.au

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

අනුශාසක **/ Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.




සාම හමුදාවක් ගෙන්වීමේ සංකල්පය

## පසුබිමේ ඇමරිකානු ආරක්ෂක ගිවිසුම්

කීර්ති වර්ණකුලසූරිය

එක්සත් ජාතීන්ගේ සංවිධානය ආර්. 2 පී ප්‍රඥප්තිය සිහිපත් කරමින් ශ්‍රී ලංකාවට අනතුරු අඟවා ඇත. මේ ප්‍රඥප්තිය යටතේ රටෙහි ජනතාව රැකීමට රජය අපොහොසත් නම් සාම හමුදාවක් මෙරටට එවීමට හැකි වේ. මෙම ආර් 2 පී ප්‍රඥප්තිය ගැන එක්සත් ජාතීන්ගේ සංවිධානය ශ්‍රී ලංකාවට සිහිපත් කළේ බී. බී. සී. සේවාව සහ බ්‍රිතාන්‍ය පුවත්පත් තුනක් මෙරට පවතින තත්ත්වයට සිංහල බෞද්ධයන්ට දොස් නැඟීමය. මෙහිදී අයිසිස් ත්‍රස්තයන්ගේ බිහිසුණු ප්‍රහාර අමතක කර ඇත. ඒ වෙනුවට මෙරට මුස්ලිම් ජනතාව ඇවිස්සීම සඳහා ශුද්ධ වූ කුරාණය බිමට විසි කර ඇති බව ලන්ඩන් ගාඩියන් පුවත්පත කියා සිටියේය.

එහෙත් පාස්කු ඉරිදා සිද්ධියෙන් දින ගණනකට පසු වයඹ පළාතේ සිදු වූ ප්‍රහාර එල්ල කිරීමට සම්බන්ධ පිරිස ගැන එම මාධ්‍ය හෙළි කළේ නැත.

මෙරට ඩොලර් අරමුදල් ලබන්නන් සහ විදේශ රාජ්‍යනොවන සංවිධාන විසින් මේ සතියේදී සාවද්‍ය තොරතුරු තොග පිටින් විදේශගත කරනු ලැබීය.

එහෙත් රජය බලාසිටියේය.
සමාජ ජාල මාධ්‍ය අවහිර කරනු ලැබුවත් ඇතැමුන් විසින් උපක්‍රම භාවිත කරමින් සාවද්‍ය පුවත් හා ඡායාරූප විදේශ ගත කළහ. ජර්මනියේ -. සී. එස්. සංවිධානය ඊට හොඳම නිදසුනකි.

මේ පසුබිම මැද මෙරට ගිනි ඇවිලවීමට උත්සාහ කරන්නේ කවුරුන්ද යන්න සනාථ වී තිබේ. 1983 ජුලි කලබලය අපි දුටුවෙමු. කොළඹ බණ්ඩාරනායක සමරුහලේ පැවැති සෝනි සමාගමේ මාධ්‍ය සාකච්ඡාවට ගිය අපට අතර මඟදී එය නතර කර දැමූ බව සංවිධායකයන් පැවසුවේ බොරැල්ලේ කලබල සිදුවන බව පැවසීම නිසාය.

එවකට අමාත්‍ය සිරිල් මැතිව්ගේ පාලනය යටතේ පැවැති දුම්කොළ සංස්ථාවේ ත්‍රිරෝද රථවල නැඟුණු මැරවරයන් පොලු මුගුරු රැගෙන යන අයුරු අපට දැක ගත හැකි විය.

එම කලබලකාරී තත්ත්වය මහා විනාශයක් විය. සිංහල සිනමාවට අපමණ සේවයක් කළ චිත්‍රපට අධ්‍යක්ෂ වෙස්කුඩ් පැට්රෝම්ා ගමන් ගත් රිය කළුබෝවිලදී නතර කළ මැරයන් ඔහුට පහරදී රථයට ගිනිතබා ඔහුව මරා දැමූහ. හැදල විජය චිත්‍රාගාරයද ගින්නෙන් දැවී ගියේය.

එදා ජේ. ආර්. ජයවර්ධන රජය මේ මැර කල්ලි අත්අඩංගුවට ගත්තේ නැත. ඒ වෙනු වට කොමියුනිස්ට් පක්ෂය සහ ජ. වි. පෙ. තහනම් කෙරුණි.

වයඹ පලාතේ සිදුවීම්වලටද පිටස්තර පිරිස් සම්බන්ධ බව හෙළි විය. එහිදී සිදු වූ දේපළ විනාශය කිව නොහැකි වේ. මේ අවස්ථාවෙ න් ප්‍රයෝජන ගත් ඇතැම් පාර්ශව වයඹ මුස්ලිම් පල්ලි ගින්නෙන් විනාශ වී ඇති අයුරු දැක්වෙන ඡායාරූප ලොව පුරා විකාශය කරනු ලැබීය.

මින් ලෝක ප්‍රජාවට පෙන්නුම් කිරීමට උත්සාහ කළේ ශ්‍රී ලංකාවේ බෞද්ධයන් හා කතෝලිකයන් මුස්ලිම් දෙව්මැඳුරු විනාශ කර ඇති බවයි.

මේ පසුබිම මැද ආර් 2 පී නමැති ප්‍රඥප්තිය මෙරට ක්‍රියාත්මක කිරීමට මෙයට පෙරද උත්සාහයක් දියත් වූ බව හෙළි විය. කොටි සංවිධානය බේරාගැනීම සඳහා කොළඹ වාර්ගික අධ්‍යයන ආයතනයේ ප්‍රධානී රාධා